වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ දැනට පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

**තනතුර : ක්ෂුද්‍රජීවී විද්‍යාඥ**

**පුරප්පාඩු සංඛ්‍යාව : 01**

**සේවා ගණය** - මධ්‍යම කළමනාකාර (MM 1-1 )

**වැටුප් ක්‍රමය:** රු.91,690/-, 10 x2,480/-, 15x3,450/-=රු.168,240/- (MM 1-1 2025) (මාසික)+ රජයේ අනුමත දීමනා

ආරම්භක වැටුප් පියවර **:** රු.81,710/-

**අධ්‍යාපන සුදුසුකම්:**

බාහිර අයදුම්කරුවන් සඳහා

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම සහ එම විද්‍යාවේදී උපාධිය හැදෑරීමේදී එක් විෂයක් ලෙස හෝ ක්ෂුද්‍රජීවී විද්‍යාව විෂය හදාරා තිබීම.

**සමඟ**

උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා:**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා ඇති අභ්‍යන්තර අයදුම්කරුවෙකු වීම

**වයස:** අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපායි.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**ප්‍රතිලාභ :**

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික දීමනා.
2. සේවක වෛද්‍ය රක්ෂණය හා පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය/ කම්කරු වන්දි රක්ෂණය
3. සේවක අර්ථසාධක අරමුදල: සේවකයා 10% සේව්‍යයා 15% සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල සේව්‍යයා 3%
4. අධිකාරියේ සේවකයින්ට දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ

**වෙනත් :**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

අයදුම්කරුවන්ගේ වර්තමාන රැකියාව, වැටුප් විස්තර, කලින් දරණ ලද තනතුරු, සේවය කරන ලද කාල සීමාව, සමඟ අයදුම්කරු පිළිබඳ තොරතුරු ලබා ගතහැකි ඥාති සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඇතුළත්ව අයදුම්කරුගේ සම්පූර්ණ විස්තර සහිතව තමා විසින්ම පිළියෙල කරන ලද අයදුම්පත උප්පැන්න සහතිකය, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2026.10.08 දින හෝ ඊට පෙර එවිය යුතුය.** අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" ක්ෂුද්‍රජීවී විද්‍යාඥ තනතුරට බඳවා ගැනීම "** යනුවෙන් සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු/පළාත් රාජ්‍ය සේවය/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු **අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානී මගින් ද** පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් **සිය අයදුම්පත් අංශ ප්‍රධානීන්** මගින්ද එවිය යුතුය.

අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්, ඉහත සඳහන් සුදුසුකම් සහ සහතික පත් නොමැති හා දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානීන් මගින් යොමු කරනු නොලබන **අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම දැන්වීම පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙහිද පල කර ඇත. **www.cda.gov.lk**

සභාපති
පොල් සංවර්ධන අධිකාරිය
අංක 54, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

Gazette.lk